ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| --- | --- |
| දිනය | 2018 අගෝස්තු මස 27 වැනි දින |

## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2018 ජූනි

### සමස්ත නිරීක්ෂණ

2018 ජූනි මාසයේදී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. එ.ජ. ඩොලර් මගින් දැක්වූ විට වසර තුළ මෙතෙක් වාර්තා වූ අඩුම වෙළඳ හිඟය ජූනි මාසයේදී වාර්තා වුවද, අපනයන ආදායම් ඉහළ යෑමට වඩා වැඩි වේගයකින් ආනයන වියදම් ඉහළ යෑම හේතුවෙන් 2017 වසරේ ජූනි මාසය හා සැසැඳීමේදී 2018 ජූනි මාසයේදී වෙළඳ හිඟය සැලකිය යුතු ලෙස පුළුල් විය. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2017 ජූනි මාසයට සාපේක්ෂව අඩු වීමක් පෙන්නුම් කළද, වසර ආරම්භයේ සිට දක්නට ලැබුණු වර්ධන ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින් 2018 ජූනි මාසයේදී සංචාරක ඉපැයීම් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි පස්වන වාරිකය සහ හම්බන්තොට වරාය පැවරීමේ තෙවන වාරිකය ලැබීම හේතුවෙන් ගෙවුම් තුලනයේ මූල්‍ය ගිණුම ශක්තිමත් වුවද, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ සහ කොළඹ කොටස් වෙළඳපොළෙහි ද්විතීයික වෙළඳපොළ වෙතින් වූ විදේශීය ආයෝජන ඉවත් කර ගැනීම් හේතුවෙන් ගෙවුම් තුලනය මත යම් පීඩනයක් ඇති විය. දේශීය සහ ගෝලීය විදේශ විනිමය වෙළඳපොළවල වර්ධනයන් පිළිබිඹු කරමින් 2018 ජූනි මස අවසාන වන විට ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 3.4 කින් අවප්‍රමාණය වූ අතර, 2018 අගෝස්තු මස 27 වන දින වන විට සියයට 5.0 කින් අවප්‍රමාණය විය. 2018 ජූනි මස අවසානය වන විට රටෙහි දළ නිල සංචිත එ.ජ. ඩොලර් බිලියන 9.3 ක් විය.

## සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරීත්වයෙහි සාරාංශය (අ)

| කාණ්ඩය | 2017 ජූනි (එ.ජ.ඩො. මිලියන) | 2018 ජූනි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2017 ජන.-ජූනි (එ.ජ.ඩො. මිලියන) | 2018 ජන.-ජූනි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 987 | 1,024 | 3.8 | 5,398 | 5,732 | 6.2 |
| ආනයන | 1,541 | 1,819 | 18.1 | 10,149 | 11,441 | 12.7 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -554 | -795 | | -4,751 | -5,709 | |
| සංචාරක ඉපැයීම් | 229 (ආ) | 272 (ඇ) | 19.0 | 1,874 (ආ) | 2,160 (ඇ) | 15.3 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 591 (ඈ) | 524 | -11.4 | 3,591 (ඈ) | 3,624 | 0.9 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඉ) | 38 | 0.3 | | 229 | 53 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 303 | 157 | | 3,369 | 3,838 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 158 | 48 | | 730 | 553 | |
| දිගුකාලීන ණය | 145 | 109 | | 689 | 785 | |
| ඒකාබද්ධ ණය පහසුකම් | - | - | | 450 | - | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | | 1,500 | 2,500 | |
| ජා.මූ. අරමුදල - විස්තීර්ණ ණය පහසුකම | - | 252 | | - | 252 | |
| විදේශ සෘජු ආයෝජන (ඊ) | | | | 193 | 492 | |
| සමස්ත ශේෂය | | | | 1,563 | 1,148 | |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2017 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2018 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය
(ඈ) සංශෝධිත
(ඉ) ද්විතීයික සහ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ
(ඊ) සෑම කාලපරිච්ඡේදයක් සඳහාම දත්ත පවතිනුයේ පළමු මාස තුන සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ සෘජු ආයෝජන ඇතුළත් වේ

### වෙළඳ ශේෂය

ආනයන වර්ධනය ඉහළ යෑම හේතුවෙන් වෙළඳ ගිණුමේ හිඟය 2017 වසරේ ජූනි මාසයට සාපේක්ෂව 2018 වසරේ ජූනි මාසයේදී අඛණ්ඩව පුළුල් විය. 2018 වසරේ පළමු භාගය තුළ සමුච්චිත වෙළඳ හිඟය 2017 වසරේ පළමු භාගයට සාපේක්ෂව කැපී පෙනෙන ලෙස පුළුල් විය.

### රූප සටහන 1: මාසික වෙළඳ ශේෂය




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය

**රූප සටහන 2: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

2018 ජූනි මාසයේ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම වසර තුළදී දෙවැනි වරටත් එ.ජ. ඩොලර් බිලියනය ඉක්මවමින් එ.ජ. ඩොලර් මිලියන 1,024 දක්වා ඉහළ ගිය අතර, කාර්මික අපනයන ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. කාර්මික අපනයන සැලකූවිට, රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, මේ සඳහා යුරෝපා සංගමය සහ ඇමෙරිකා එක්සත් ජනපදය වෙතින් වූ ඉල්ලුම ඉහළ යෑම මෙන්ම සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ වෙත සිදුකළ අපනයන ඉහළ යෑම ද හේතු විය. නැව් සහ ගුවන් යානා සඳහා භාවිතා කරන ඉන්ධන සඳහා වූ අපනයන මිල ගණන් සහ අපනයන පරිමාවන් යන දෙකම ඉහළ යෑම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම ද කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන්ම ටයර් අපනයනයෙන් ලද ඉහළ ආදායම හේතුවෙන් රබර් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගියේය. විද්‍යුත් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ ඉලෙක්ට්‍රොනික උපකරණ අපනයනය ඉහළ යෑම හේතුවෙන් මෙම මාසය තුළදී යන්ත්‍ර සූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයන ආදායම ද කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. මේ අතර, යකඩ හා වානේ උපාංග සහ ඇලුමිනියම් උපාංග අපනයන ඉහළ යෑම හේතුවෙන් මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගියේය. කෙසේ වුව ද, ප්‍රධාන වශයෙන්ම 2017 ජූනි මාසයේදී නැව් දෙකක් අපනයනය කිරීම හේතුවෙන් ලද ඉහළ ආදායමෙහි බලපෑම නිසා මෙම මාසය තුළදී ප්‍රවාහන උපකරණ අපනයන ආදායම සැලකිය යුතු ලෙස පහත වැටුණි. මීට අමතරව, 2018 ජූනි මාසයේ දී ආහාර, පාන වර්ග හා දුම්කොළ සහ සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් අපනයන ද 2017 ජූනි මාසයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස පහත වැටුණි. මේ අතර, මුහුදු ආහාර, සකස් නොකළ දුම්කොළ සහ රබර් හැර අනෙකුත් සියලුම කාණ්ඩවල දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන් 2018 ජූනි මාසයේ දී කෘෂිකාර්මික අපනයන ආදායම පහත වැටුණි. 2018 ජූනි මාසයේ දී තේ අපනයන පරිමාව හා මිල ගණන් යන දෙකම පහත වැටීම හේතුවෙන් තේ අපනයන ආදායම පහත වැටුණි. මීට අමතරව, කුරුඳු සහ සාදික්කා හා වසාවාසි අපනයන ඉහළ ගිය ද, ඊට වඩා වැඩි වේගයකින් ගම්මිරිස්, කරාබුනැටි හා වෙනත් කුළුබඩු අපනයන පහත වැටීම හේතුවෙන් 2018 ජූනි මාසයේ දී කුළුබඩු අපනයන ආදායම සුළු වශයෙන් පහත වැටුණි. කෙසේ වුව ද, යුරෝපා සංගමය වෙත මුහුදු ආහාර අපනයනය කිරීම සඳහා පනවා තිබූ තහනම ඉවත්

කිරීමේ සහ ජී.එස්.පී. ප්ලස් සහනය නැවත ලබාගැනීමේ යහපත් බලපෑම පිළිබිඹු කරමින් මෙම මාසය තුළ දී මුහුදු ආහාර අපනයන මිල ගණන් සහ අපනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් මුහුදු ආහාර අපනයන ආදායම කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. 2018 ජූනි මාසයේ දී ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ අපනයන සඳහා ප්‍රධාන වෙළඳපොළ ලෙස ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ඉතාලිය සහ ජර්මනිය පැවති අතර, එම රටවල් වෙත සිදු කරන ලද අපනයන මුළු අපනයන ආදායමෙන් සියයට 48ක් පමණ විය.

**සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)**

| කාණ්ඩය | 2017 ජූනි (එ.ජ.ඩො. මිලියන) | 2018 ජූනි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2017 ජන.- ජූනි (එ.ජ.ඩො. මිලියන) | 2018 ජන.- ජූනි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **749.8** | **800.7** | **6.8** | **4,065.8** | **4,433.7** | **9.0** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 58.9 | 38.7 | (34.2) | 190.8 | 232.3 | 21.7 |
| සත්ත්ව ආහාර | 7.2 | 8.5 | 18.1 | 40.6 | 54.2 | 33.5 |
| රෙදිපිළි හා ඇඟලුම් | 398.1 | 453.5 | 13.9 | 2,383.6 | 2,519.0 | 5.7 |
| එයින් ඇඟලුම් | 375.4 | 419.4 | 11.7 | 2,244.7 | 2,350.8 | 4.7 |
| රෙදිපිළි | 15.9 | 25.7 | 61.7 | 99.7 | 120.6 | 20.9 |
| වෙනත් රෙදිපිළි සැකසුම් | 6.8 | 8.3 | 21.5 | 39.2 | 47.5 | 21.3 |
| රබර් නිෂ්පාදිත | 73.1 | 77.3 | 5.8 | 388.5 | 426.4 | 9.8 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 20.6 | 21.7 | 5.1 | 123.9 | 151.4 | 22.2 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 28.5 | 45.0 | 57.7 | 180.4 | 219.9 | 21.9 |
| ප්‍රවාහන උපකරණ | 54.3 | 8.5 | (84.3) | 125.0 | 51.0 | (59.2) |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 29.2 | 52.7 | 80.7 | 176.9 | 272.0 | 53.8 |
| රසායනික නිෂ්පාදිත | 12.0 | 15.2 | 27.3 | 70.2 | 81.8 | 16.5 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 11.1 | 12.4 | 12.0 | 67.5 | 70.4 | 4.3 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 4.0 | 3.8 | (3.0) | 17.7 | 10.2 | (42.4) |
| සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 15.4 | 12.5 | (18.9) | 77.7 | 77.5 | (0.2) |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 6.7 | 6.7 | 0.7 | 35.8 | 38.6 | 7.7 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 6.8 | 15.1 | 121.0 | 51.4 | 77.0 | 49.9 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 3.2 | 2.8 | (10.9) | 16.0 | 14.7 | (8.4) |
| වෙනත් | 20.8 | 26.1 | 25.5 | 119.7 | 137.3 | 14.7 |
| **2.කෘෂිකාර්මික අපනයන** | **232.0** | **219.4** | **(5.4)** | **1,306.4** | **1,272.3** | **(2.6)** |
| තේ | 138.6 | 129.6 | (6.5) | 728.4 | 728.9 | 0.1 |
| රබර් | 2.0 | 2.2 | 10.4 | 23.9 | 18.7 | (21.7) |
| පොල් | 30.1 | 25.0 | (17.1) | 173.8 | 150.1 | (13.6) |
| කුළුබඩු | 27.8 | 27.7 | (0.5) | 160.7 | 149.7 | (6.9) |
| එළවළු | 2.3 | 1.8 | (20.7) | 14.7 | 12.6 | (14.2) |
| සකස් නොකළ දුම්කොළ | 2.9 | 3.5 | 20.9 | 16.4 | 16.8 | 2.5 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 13.1 | 10.6 | (18.6) | 71.4 | 62.1 | (13.0) |
| මුහුදු ආහාර | 15.2 | 18.9 | 24.5 | 117.1 | 133.4 | 13.9 |
| **3.ඛනිජ හා වෙනත් අපනයන** | **5.5** | **4.2** | **(22.3)** | **25.4** | **25.9** | **1.9** |
| **මුළු අපනයන** | **987.3** | **1,024.4** | **3.8** | **5,397.6** | **5,731.9** | **6.2** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය

2018 ජූනි මාසයේ දී වෙළඳ භාණ්ඩ ආනයන එ.ජ. ඩොලර් මිලියන 1,819 ක් දක්වා ඉහළ ගිය අතර, ඉන්ධන, රථ වාහන සහ ප්‍රවාහන උපකරණ ආනයන වෙනුවෙන් ඉහළ වියදමක් දැරීමට සිදු වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිතවල ආනයන මිල ගණන් හා පරිමාවන් ඉහළ යෑම හේතුවෙන් අන්තර් භාණ්ඩ යටතේ වර්ග කර ඇති ඉන්ධන ආනයන වියදම මෙම මාසය තුළ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මීට අමතරව, විශේෂයෙන්ම රෙදිපිළි හා නූල් ඇතුළු සියලුම කාණ්ඩවල වියදම ඉහළ යාම පිළිබිඹු කරමින් 2018 ජූනි මාසයේ දී රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම ඉහළ ගියේය. එසේම, මූල ලෝහ, තිරිඟු හා ඉරිඟු, පොහොර හා ආහාර සැකසුම් ආනයන වියදම් ද මෙම මාසය තුළ දී අන්තර් භාණ්ඩ ආනයන ඉහළ යෑම සඳහා දායක විය. කෙසේ වුවද, 2016 වසරේ මුල් කාලයේ සිට කැපී පෙනෙන ලෙස වර්ධනය වූ රත්‍රන් ආනයන වියදම 2018 වසරේ ජූනි මාසයේ දී අඛණ්ඩව දෙවැනි මාසයටත් පහත වැටුණි. මේ අතර, සිලින්ඩර ධාරිතාව 1,000 ට අඩු මෝටර් රථ, දෙමුහුන් රථ සහ විද්‍යුත් මෝටර් රථ ආනයනය කැපී පෙනෙන ලෙස ඉහළ යෑම හේතුවෙන් 2018 වසරේ ජූනි මාසයේ දී පාරිභෝගික භාණ්ඩ යටතේ වර්ග කර ඇති පෞද්ගලික භාවිතය සඳහා වන රථවාහන ආනයන වියදම සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. සිලින්ඩර ධාරිතාව අඩු මෝටර් රථ මත වන බදු 2018.08.01 දින සිට බලපැවැත්වෙන පරිදි ඉහළ දැමීම හේතුවෙන් රථවාහන ආනයනය ඉදිරි මාසවල දී යම්තාක් දුරට පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, පාරිභෝගික භාණ්ඩ යටතේ වර්ග කර ඇති මුහුදු ආහාර, සහල් සහ සීනි ආනයනය පහළ යෑම මෙම මාසය තුළදී සමස්ත ආනයන වියදම මත වූ පීඩනය අඩු කිරීමට දායක විය. මේ අතර, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම පහත වැටුණ ද, නැව් හතරක් ආනයනය කිරීම සහ කැබ්රථ සහ ත්‍රී රෝද රථ වැනි වාණිජ කටයුතු සඳහා යොදා ගනු ලබන රථ වාහන ඉහළ යෑම හේතුවෙන් ප්‍රවාහන උපකරණ ආනයන වියදම ඉහළ යෑම ආයෝජන භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම සඳහා දායක විය. 2018 වසරේ ජූනි මාසයේ දී ශ්‍රී ලංකාව විසින් භාණ්ඩ ආනයනය කළ ප්‍රධාන රටවල් ලෙස චීනය, ඉන්දියාව, ජපානය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ සිංගප්පූරුව පැවති අතර, එම රටවලින් සිදු කළ ආනයන සමස්ත ආනයන වියදමෙන් සියයට 58ක් පමණ විය.

**රූප සටහන 3: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)

| කාණ්ඩය | 2017 ජූනි (එ.ජ.ඩො. මිලියන) | 2018 ජූනි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2017 ජන.-ජූනි (එ.ජ.ඩො. මිලියන) | 2018 ජන.-ජූනි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **322.7** | **425.9** | **32.0** | **2,221.8** | **2,620.7** | **18.0** |
| ආහාර හා පාන වර්ග | 131.4 | 125.8 | (4.2) | 923.5 | 907.1 | (1.8) |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 7.5 | 1.9 | (74.4) | 138.1 | 109.7 | (20.5) |
| එයින් සහල් | 6.6 | 0.5 | (92.1) | 131.8 | 100.1 | (24.0) |
| සීනි හා රසකැවිලි | 25.9 | 22.6 | (13.0) | 150.7 | 152.9 | 1.5 |
| කිරි නිෂ්පාදිත | 23.5 | 28.8 | 22.7 | 160.4 | 166.7 | 3.9 |
| එළවළු | 27.1 | 28.3 | 4.7 | 176.7 | 170.0 | (3.8) |
| මුහුදු ආහාර | 20.4 | 10.6 | (47.9) | 110.8 | 104.6 | (5.6) |
| පාන වර්ග | 6.0 | 9.7 | 62.1 | 38.9 | 43.0 | 10.7 |
| කුළුබඩු | 7.3 | 8.2 | 12.4 | 50.7 | 51.9 | 2.3 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 13.7 | 15.6 | 14.0 | 97.2 | 108.2 | 11.3 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 191.3 | 300.1 | 56.9 | 1,298.4 | 1,713.7 | 32.0 |
| රථවාහන | 54.0 | 146.8 | 171.8 | 370.2 | 812.7 | 119.5 |
| බෙහෙත් සහ ඖෂධීය නිෂ්පාදිත | 45.0 | 48.3 | 7.3 | 248.7 | 258.8 | 4.0 |
| විදුලි සංදේශ උපකරණ | 16.2 | 24.8 | 53.2 | 133.3 | 141.4 | 6.1 |
| රෙදිපිළි හා උපාංග | 24.5 | 24.6 | 0.6 | 198.9 | 165.1 | (17.0) |
| ගෘහ උපකරණ | 18.4 | 18.3 | (0.4) | 128.3 | 120.0 | (6.5) |
| ගෘහ හා දැව භාණ්ඩ | 12.5 | 13.4 | 7.5 | 81.7 | 84.1 | 3.0 |
| රබර් නිෂ්පාදිත | 6.6 | 7.9 | 19.1 | 44.7 | 45.2 | 1.1 |
| ආලේප වර්ග හා සේදුම් ද්‍රව්‍ය | 7.1 | 5.7 | (18.8) | 43.4 | 36.0 | (17.1) |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 7.1 | 10.3 | 44.7 | 49.2 | 50.4 | 2.3 |
| **2. අන්තර් භාණ්ඩ** | **792.1** | **947.4** | **19.6** | **5,349.0** | **6,319.9** | **18.2** |
| ඉන්ධන | 200.6 | 342.7 | 70.9 | 1,624.5 | 2,093.6 | 28.9 |
| එයින් බොරතෙල් | 35.6 | 111.8 | 213.9 | 279.4 | 431.3 | 54.4 |
| පිරිපහදු කළ ඛනිජ තෙල් | 164.9 | 228.1 | 38.3 | 1,174.3 | 1,515.2 | 29.0 |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 56.9 | 8.5 | (85.1) | 328.0 | 495.2 | 51.0 |
| එයින් රත්‍රන් | 46.0 | 0.4 | (99.2) | 274.9 | 437.8 | 59.2 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 219.0 | 230.9 | 5.4 | 1,306.9 | 1,360.5 | 4.1 |
| රසායනික නිෂ්පාදිත | 67.1 | 72.0 | 7.4 | 408.2 | 446.0 | 9.3 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 49.1 | 52.8 | 7.5 | 302.6 | 353.0 | 16.7 |
| කඩදාසි, ඝන කඩදාසි සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 41.1 | 45.1 | 9.9 | 223.1 | 250.4 | 12.2 |
| මූල ලෝහ | 32.5 | 43.4 | 33.6 | 251.9 | 289.1 | 14.8 |
| ආහාර සැකසුම් | 18.6 | 26.8 | 44.3 | 146.8 | 162.3 | 10.5 |
| පොහොර | 12.0 | 20.6 | 71.5 | 39.1 | 121.2 | 209.6 |
| තිරිඟු හා ඉරිඟු | 7.3 | 18.1 | 148.5 | 162.5 | 193.0 | 18.8 |
| ඛනිජ නිෂ්පාදිත | 15.0 | 10.1 | (32.7) | 93.8 | 85.1 | (9.3) |
| වෙනත් | 73.1 | 76.3 | 4.5 | 461.6 | 470.7 | 2.0 |
| **3. ආයෝජන භාණ්ඩ** | **405.3** | **443.5** | **9.4** | **2,447.2** | **2,432.4** | **(0.6)** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 220.2 | 195.6 | (11.2) | 1,319.0 | 1,263.9 | (4.2) |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 128.5 | 117.2 | (8.8) | 789.6 | 759.2 | (3.9) |
| ප්‍රවාහන උපකරණ | 55.8 | 130.4 | 133.9 | 333.8 | 406.0 | 21.6 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.8 | 0.3 | (63.8) | 4.7 | 3.3 | (29.3) |
| **4. වර්ග නොකළ ආනයන** | **20.8** | **2.7** | **(87.1)** | **130.9** | **68.0** | **(48.1)** |
| **මුළු ආනයන** | **1,540.9** | **1,819.5** | **18.1** | **10,149.0** | **11,441.1** | **12.7** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

2017 වසරේ ජුනි මාසයට සාපේක්ෂව ඉන්දියාව, ඕස්ට්‍රේලියාව, සෞදි අරාබිය සහ චීනය යන රටවලින් පැමිණි සංචාරකයින් සංඛ්‍යාවේ හිතකර වර්ධනය හේතුවෙන් 2018 වසරේ ජුනි මාසයේදී සංචාරක පැමිණීම්, 146,828 ක් දක්වා සියයට 19.0 කින් වර්ධනය විය. 2018 වසරේ පළමු භාගය තුළදී පැමිණි මුළු සංචාරකයින් සංඛ්‍යාව 1,164,647 ක් වූ අතර, එය 2017 වසරේ පළමු භාගයට සාපේක්ෂව සියයට 15.3 ක වැඩිවීමකි. 2018 වසරේ ජුනි මාසයේදී සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 272 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, 2018 වසරේ පළමු භාගය සඳහා සමුච්චිත සංචාරක ඉපැයීම් ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 2,160 ක් විය. මේ අතර, පසුගිය මාසය තුළදී දක්නට ලැබුණු අඩු වීමේ ප්‍රවණතාව තවදුරටත් ඉදිරියට යමින්, 2018 වසරේ ජුනි මාසයේදී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ පෙර වසරේ ජුනි මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 524 ක් දක්වා සියයට 11.4 කින් පහත වැටුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2018 වසරේ පළමු භාගය තුළදී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 3,624 ක් දක්වා සියයට 0.9 ක සුළු වර්ධනයක් වාර්තා කළේය.

**රූප සටහන 4 : සංචාරක පැමිණීම්හි ප්‍රධාන මූලාශ්‍ර පහ**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 5 : සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




මූලයන්: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
බලපත්‍රලාභී වාණිජ බැංකු
ශ්‍රී ලංකා මහ බැංකුව

## මූල්‍ය ලැබීම්

ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ විදේශ විනිමය ගනුදෙනු ඇතුළත් කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශ ආයෝජන, 2018 වසරේ ජුනි මාසයේදී එ.ජ. ඩොලර් මිලියන 0.3 ක සුළු ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2018 වසරේ පළමු භාගය තුළදී කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශ ආයෝජන, එ.ජ. ඩොලර් මිලියන 53 ක සමුච්චිත ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. මේ අතර, 2018 වසරේ ජුනි මාසයේදී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 74 ක ශුද්ධ විදේශ ආයෝජන

ගෙවීමක් වාර්තා වූ අතර, එම නිසා 2018 ජූනි මස අවසාන වන විට සමුච්චිත ශුද්ධ ගෙවීම් එ.ජ. ඩොලර් මිලියන 176 ක් දක්වා වැඩි විය. තවද, 2018 වසරේ ජූනි මාසය සඳහා රජය වෙත වූ දිගුකාලීන ණය, එ.ජ. ඩොලර් මිලියන 115 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.

## ජාත්‍යන්තර සංචිත

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි පස්වැනි වාරිකය වන එ.ජ. ඩොලර් මිලියන 252 සහ හම්බන්තොට වරාය පැවරීම වෙනුවෙන් ලද එ.ජ. ඩොලර් මිලියන 585 ක තුන්වැනි වාරිකය සමඟ රටෙහි දළ නිල සංචිත ප්‍රමාණය, 2018 වසරේ මැයි මාසය අවසානයේදී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 8.8 සිට 2018 වසරේ ජූනි මස අවසාන වන විට එ.ජ. ඩොලර් බිලියන 9.3 ක් දක්වා ඉහළ ගියේය. මෙම සංචිත මට්ටම ආනයනික මාස 5.0 කට සමාන විය. දළ නිල සංචිත සහ බැංකු අංශයේ විදේශ වත්කම් ද ඇතුළත් මුළු විදේශීය වත්කම් ප්‍රමාණය, 2018 වසරේ ජූනි මස අවසාන වන විට ආනයනික මාස 6.1 කට සමාන වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 11.3 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

**රූප සටහන 6 : දළ නිල සංචිත සහ සමස්ත ශේෂය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

2018 වසරේ අගෝස්තු 27 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 5.0 කින් අවප්‍රමාණය විය. තවද, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල යුරෝ, ස්ටර්ලින් පවුම, ජපන් යෙන් සහ කැනේඩියානු ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණය වූ අතර, ඕස්ට්‍රේලියානු ඩොලරය සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව අතිප්‍රමාණය විය.

**රූප සටහන 7 :**
**එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4 :**
**තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2017 | 2018 අගෝ. 27 දක්වා අතිප්‍රමාණය (+) / අවප්‍රමාණය (-) |
|---|---|---|
| එ.ජ. ඩොලරය | -2.0% | -5.0% |
| යුරෝ | -13.5% | -2.5% |
| ස්ටර්ලින් පවුම | -10.5% | -0.6% |
| ජපන් යෙන් | -5.1% | -6.4% |
| කැනේඩියානු ඩොලරය | -8.6% | -1.6% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -9.0% | +1.1% |
| ඉන්දියානු රුපියල | -7.5% | +3.7% |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව